# ලෝකය පවතින බව දන්නේ කවුද?

නිරපෙක්ෂ අවකාශය යන්න නිරීක්ෂනය නොකළ හැකි වුව ද, එයට පැවතිය නොහැකි ද යන ප්‍රශ්නය ඇසීමට හැකි ය. අපේ ඉන්ද්‍රියට ගෝචර නොවී නිරපෙක්ෂ අවකාශයට පැවතිය නො හැකි ද? ඉන්ද්‍රියානුභූතවාදී මාක් පඩිවරයාට අනුව නම් එවැන්නක් ගැන කතාකිරීම භෞතික විද්‍යාවේ දී තේරුමක් නැති දෙයක් වෙයි. ඔහුට බෞද්ධ ආභාසයක් ලැබී ඇති හෙයින් මෙය ඇතැම් විට බෞද්ධ මතය යැයි යමකු වරදවා තේරුම් ගත හැකි ය.

අර්නස්ට් මාක් විද්වතා බෞද්ධ පොතපත කියවූවා පමණක් නොව බෞද්ධයකු ලෙස ජීවිතය ගත කෙළේ යැයි ද සමහරු කියති. ඔහු ගාල්ලේ වැඩ විසූ භික්ෂූන් වහන්සේ නමක සමග ලියුම් ගනු දෙනු කර ඇති බවට ද සාධක වේ යැයි කියැවෙයි. ඒ සියල්ල සත්‍ය වුව ද, ඔහුට බෞද්ධ ආභාසයක් ලැබුණ ද, ඔහු සිංහල බෞද්ධයෙක් නො වී ය. වැඩිම වුවහොත් ඔහු අපරදිග බෞද්ධයෙක්, ඔස්ට්‍රියානු බෞද්ධයෙක් විය.

මාක් විද්වතා ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප භෞතික විද්‍යාවේ දී ප්‍රතික්ෂේප කෙළේ ය. එහෙත් ඉන් කියැවෙන්නේ ඔහු ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප ප්‍රතික්ෂේප කළ බවක් නො වෙයි. ඔහු කියා සිටියේ භෞතික විද්‍යාවේ ප්‍රපංච තේරුම් කිරීමේ දී, ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප යොදා නොගත යුතු බව ය. ඒ එවැනි දැඟි පැවැත්ම පිළිබඳ ප්‍රශ්න තිබූ හෙයින් ය. එහෙත් ප්‍රශ්නය වනුයේ පැවැත්ම යනු කුමක් ද යන්න ය.

දර්ශනයේ ඉතාම මූලික වූ මේ ප්‍රශ්නය විසඳා ගැනීමට වෙනම ම සංවාදයක් අවශ්‍ය වෙයි. එහෙත් කෙටියෙන් හෝ ඒ පිළිබඳ යමක් කිවයුතු වෙයි. පැවතීම යන්න දර්ශනයෙහි සාමාන්‍යයෙන් සත්බව (ontology) යන්නෙන් හැඳින්වෙයි. නිරීක්ෂකයාගෙන් තොරව යමක් පවතින්නේ ද, පැවතීම යනු කුමක් ද ආදී ප්‍රශ්නවලට එහි දී පිළිතුරු ලැබෙයි. සිංහල ථෙරවාදී බෞද්ධයනට අනුව නිරීක්ෂකයකුගෙන් තොරව කිසිවක් පැවතිය නො හැකි ය. නිරීක්ෂකයා පවා පවතින්නේ නිරීක්ෂකයාට සාපේක්ෂව ය. අපට මුහුණ පෑමට ඇති ප්‍රධානම ගැටළුව නිරීක්ෂකයකු පවතින්නේ ද යන්න ය.

බටහිර විද්‍යාවෙහි මේ ප්‍රශ්නය අඩුතරමින් සාකච්ඡාවත් නො වෙයි. එහි නිරීක්ෂකයන් පවතින්නේ යැයි උපකල්පනය කෙරෙයි. නිව්ටෝනීය භෞතික විද්‍යාවෙහි පමණක් නොව අයින්ස්ටයිනීය විශේෂ සාපේක්ෂතාවාදයෙහි ද නිරීක්ෂකයන් පවතින්නේ යැයි උපකල්පනය කෙරෙයි. සාධාරණ සාපේක්ෂතාවාදයෙහි අවකාශ කාලයෙහි පැවැත්ම තීරණය වන්නේ ද්‍රව්‍ය (විකිරණ ද ඇතුළුව) මත ය. අවකාශ කාලය ඇතිවනවාත් සමග නිරීක්ෂකයෝ ද ඇතිවෙති. එනම් ද්‍රව්‍ය සමග නිරීක්ෂකයෝ ද වෙති. එහි දී ද නිරීක්ෂකයන්ගෙන් තොරව ද්‍රව්‍ය හා අවකාශ කාලය පවතින අතර, නිරීක්ෂකයන්ට ද පැවැත්මක් වෙයි.

මේ තත්ත්වය තරමක් දුරට හෝ වෙනස්වන්නේ ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි ය. නිරීක්ෂකයන්ගෙන් තොරව පවතින ද්‍රව්‍ය ගුණ ගැන කතාකිරීම නිෂ්ඵල කාර්යයක් යැයි එහි දී කියැවෙයි. නිරීක්ෂකයකු ද්‍රව්‍යයෙහි යම් ගුණයක් නිරීක්ෂණය කිරීමට පෙර ද්‍රව්‍යයට ඒ ගුණය නැත. ද්‍රව්‍යයට ගුණයක් ලැබෙන්නේ නිරීක්ෂකයකු ඒ ගුණය නිරීක්ෂණය කිරීම නිසා යැයි බෝර් විද්වතා විසින් ඉදිරිපත්කරන ලද කෝපන්හේගන් විවරණයෙහි කියැවෙයි. මේ විවරණය ගලා එන්නේ ඉන්ද්‍රියානුභූතවාදයෙන් ය. එහෙත් ප්‍රශ්නය වන්නේ එහි ද නිරීක්ෂකයන් පවතින්නේ කෙසේද යන්න සාකච්ඡා නො වීම ය.

වැඩිදුර යෑමට පෙර ඒ ඒ අංශවල පැවැත්ම ගැන කියැවෙන දෑ සාරාංශකර ගනිමු. එයට ද කලින් කිවයුත්තක් වෙයි. කලින් ද කියා ඇති පරිදි සත්බව, ඥානවිභාගයෙන් (epistemology) වෙන්වන්නේ බටහිර දර්ශනයෙහි ය. ඥානවිභාගය යනු දැනුම පිළිබඳ ප්‍රවාද වෙයි ; හෙවත් දැනුම පිළිබඳ දැනුම වෙයි. දැනුම පිළිබඳ ප්‍රවාද සත්බවෙන් වෙන්කර ඉගැනීමට අධ්‍යයනයකිරීමට බටහිර දර්ශනයෙහි දී හැකිවෙයි. එහෙත් සාමාන්‍යයෙන් පෙරදිග දර්ශනවල ඒ එසේ නො වෙයි. දැනුම පිළිබඳ සාකච්ඡාවක දී පැවැත්ම ද සාකච්චා වෙයි. එබැවින් පෙරදිග දර්ශනවල ඥානවිභාගය සත්බවෙන් වෙන් නො කෙරෙයි.

© Prof. Nalin De Silva

බටහිර දර්ශනයෙහි යථාර්ථවාදී (realist) ගුරුකුලයට අනුව නිරීක්ෂකයෝ ද ද්‍රව්‍යද වෙති. එහි වැඩිදුරටත් නිරීක්ෂකයන්ගෙන් තොරව ද්‍රව්‍යයට පැවතිය හැකි ය. නිරීක්ෂකයා යනු විඥානයක් සහිත ප්‍රාණඇති සත්ත්වයකු ලෙස සාමාන්‍යයෙන් සැලකෙයි. බටහිර දර්ශනයෙහි මේ සත්ත්වයා අන්කවරකු හෝ නොව මිනිසා ය. මිනිසුන්ගෙන් හා අනෙක් සතුන්ගෙන් තොරව වුවද ලෝකය පවතින්නේ ය යන්න සාමාන්‍යයෙන් බටහිර යථාර්ථවාදී ගුරුකුලයෙහි කියැවෙයි. එමෙන් ම නිරීක්ෂකයන්ට ද සාපේක්ෂක බවකින් තොරව පැවතිය හැකි ය. එනම් නිරීක්ෂකයන්ට ද නිරපේක්ෂ පැවැත්මක් වෙයි. ලෝකය නිරීක්ෂකයන්ගෙන් තොරව, නිරපේක්ෂව පවතින අතර ඒ ලෝකයෙහි නිරපේක්ෂව ම නිරීක්ෂකයෝ වෙති.

මේ දර්ශනය ගලා එන්නේ යුදෙව් චින්තනයෙන් ය. මේ කියැවෙන්නේ අන්කිසිවක් නොව දෙවියන්වහන්සේ විසින් ලෝකය මවන ලද බවත් පසුව සත්වයන් මවන ලද බවත් අවසානයේ දී මිනිසා ද මවන ලද බවත් ය. විඥානයක් ඇති මිනිසා ලෝකයෙහි ඇතිවීමට ද පෙර ලෝකය පැවතී ඇත. ලෝකයෙහි පැවැත්ම මිනිසා මත රඳා නොපවතියි. එහෙත් මෙහි දී යථාර්ථවාදියකු මෙවැනි ප්‍රශ්නයක් නගනු ඇත. ලෝකය මිනිසාගෙන් තොරව පැවතීම දෙවියන් වහන්සේගේ නිර්මාණය සමග සම්බන්ධ වන්නේ කෙසේ ද? විඥානයක් ඇති කිසිවකුගේ පැවතීමකින් තොරව ලෝකය පවතින්නේ ය යන්න යථාර්ථවාදයේ නො කියැවෙන්නේ ද? යථාර්ථවාදීන් දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප නො කරන්නේ ද?

බැලූ බැල්මට මෙහි සත්‍යයක් වෙයි. එහෙත් එසේ වන්නේ සත්බව ඥානවිභාගයෙන් වෙන්කර ගැනීම නිසා ය. විඥානයක් සහිත සත්ත්වයකුගෙන් තොරව ලෝකය පවතින්නේ යැයි කී විට ලෝකය පිළිබඳ දැනුමට කුමක් වේ ද? ලෝකය පවතින්නේ කවදා සිට ද? එයට යම්කිසි ආරම්භයක් වී ද? එසේත් නැත්නම් සදාකාලික ව ලෝකය පවතින්නේ ද? සදාකාලික යනු කුමක් ද? කාලය යනු කුමක් ද? කාලය ද පවතින දෙයක් ද? කාලය පවතින්නේ නම් ඒ ඇතිවූයේ ලෝකය ඇතිවීමට පෙර ද? පසු ද? පෙර පසු යන සංකල්ප කාලය සමග සම්බන්ධ බැවින් කාලය ඇතිවීමට පෙර යන්න නිවැරදි වහරක් ද? මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු දීමට යෑමේ දී සත්බව ඥානවිභාගයෙන් වෙන්කර ගැනීමට නොහැකි බව පෙනී යනු ඇත.

යථාර්ථවාදීන් ලෝකය නිරීක්ෂකයාගෙන් තොරව පවතින්නේ යැයි කී පමණින් සත්බවෙහි ප්‍රශ්නය නො විසඳෙයි. ලෝකය එසේ පවතින බව දන්නා අයෙක් වෙති. අඩුම තරමින් යථාර්ථවාදියා ඒ බව දනියි. සත්බව ද අවසාන වශයෙන් ගත්කල දැනුමක් වෙයි. ලෝකය පවතින්නේ ය යන්න දැනුමක් වෙයි. එය එසේ නො වේයැයි කිසිම යථාර්ථවාදියකුට කිවහැකි නො වෙයි. ලෝකය පවතින්නේය යන්න කිසිවකුගේ දැනුමක් නොවී ලෝකය පවතින්නේ ද? එසේ නම් ඒ ආකාරයෙන් ලෝකය පවතින්නේ යැයි කීම දැනුමක් වෙයි. යථාර්ථවාදියා කෙතරම් උත්සාහකළ ද, ලෝකය පවතින්නේය යන්න දැනුමක් බව වසන්කළ නො හැකි ය. බටහිර දර්ශනයෙහි සත්බව ඥානවිභාගයෙන් වෙන්කිරීම ම ප්‍රශ්නයක් වන්නේ එබැවින් ය.

කෙසේ වෙතත් යථාරථවාදියාට තමන්ගෙන් හෝ නිරීක්ෂකයකුගෙන් හෝ තොරව ලෝකය පවතින බව තමන්ගෙන් තොරව පෙන්වාදිය නො හැකි ය. වාස්තවික, එනම් නිරීක්ෂකයාගෙන් ස්වායත්ත, ලෝකයක් පවතින බව වාස්තවික ව පෙන්වීමට කිසිවකුටවත් නො හැකි ය. යථාර්ථවාදීහු දෙවියන් වහන්සේ නැතැයි කීවත්, හරයෙන් දෙවියන් වහන්සේ ගනිති. ලෝකය පවතින්නේ යැයි කීම දැනුමක් බැවින් නිරීක්ෂකයාගෙන් තොරව ලෝකයක් පැවතිය හැක්කේ, එසේ පැවතීම පිළිබඳ දැනුමක් ඇත්තකු සිටින්නේ නම් පමණකි. මේ තැනැත්තාට දෙවියන් වහන්සේ කීව ද වෙනත් නමක් කීව ද එවැන්නකු නොමැතිව ලෝකය පවතින බව පිළිබඳ දැනුමක් තිබිය නො හැකි ය. මෙහි දී අප ඒ තැනැත්තා යැයි කීව ද එලෙස තැනැත්තකු වීම අනිවාර්ය නො වෙයි. අප තැනැත්තා යන පදය යොදා ගන්නේ එලෙස දැනුම් ඇත්තේ තැනැත්තන්ට යැයි මිනිසුන් සාමාන්‍යයෙන් පිළිගන්නා බැවින් ය. මෙහි දී අවශ්‍ය වන්නේ දැනුමක් ඇති කුමක් හෝ වස්තුවක් පමණ ය.

මේ ප්‍රශ්නයට වෙනත් පිළිතුරක් ද දිය හැකි ය. එනම් ලෝකය පවතින බව දන්නේ ලෝකය ම බව ය. එහෙත් එයින් කියැවෙන්නේ බටහිර යථාර්ථවාදියාට අවශ්‍ය දෙය නො වෙයි. යථාර්ථවාදියාට කීමට අවශ්‍යවන්නේ ලෝකය කිසිම අයකුට සාපේක්ෂ නොවී පවතින බව ය. එනම් ලෝකය පවතින බව දන්නා කිසිවකු නොමැතිව ලෝකය පවතින බව

© Prof. Nalin De Silva

ය. එහෙත් ලෝකය පවතින බව ලෝකය දන්නේ යැයි කී විගස නිරීක්‍ෂකයා පැමිණෙයි. දැන් ලෝකය පවතින්නේ ලෝකයට සාපේක්‍ෂව ය. නිරීක්‍ෂකයා යන්නෙන් කියැවෙන්නේ යම් දැනුමක්, විඥානයක් ඇති අයකු ය. ලෝකයට ලෝකය පිළිබඳ දැනුමක් ඇතැයි කී විට ලෝකය ම නිරීක්‍ෂකයා බවට පත්වෙයි.

එවැනි පිළිතුරක් යුදෙව් චින්තනයෙහි වලංගු නො වෙයි. එහි නිරීක්‍ෂකයා සිටින්නේ නිරීක්‍ෂ්‍යයෙන් බාහිරව ය. එය යුදෙව් චින්තනයෙහි මෙන්ම ඒ චින්තනයෙන් ද ගලා එන ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ද වලංගු නො වෙයි. එබැවින් බටහිරයන්ට ලෝකයේ පැවැත්ම පිළිබඳ ව හා පැවැත්ම පිළිබඳ දැනුම පිළිබඳ ව ඒ පිළිතුර දිය හැකි නො වෙයි. බටහිර දර්ශනයෙහි සත්බව හා ඥානවිභාගය යනු දෙකක් බව ද අපි දුටුවෙමු. එවැනි චින්තනයක හා දර්ශනයක ලෝකය පිළිබඳ දැනුම ලෝකයට තිබිය නො හැකි ය. යුදෙව් චින්තනයෙහි ලෝකය මැවූ දෙවියන් වහන්සේ ලෝකයෙන් පරිබාහිරව ඇත. උන්වහන්සේට ලෝකය පිළිබඳ දැනුමක් ඇත. ඒ ලෝකයට පරිබාහිරව සිටිමින් ය. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි යම් පද්ධතියක (මුළු ලෝකය ම හෝ එහි කොටසක හෝ) දැනුම ලබන්නේ පද්ධතියෙන් බාහිරව සිටිමින් ය. මේ සියල්ලෙන් කියැවෙන්නේ බටහිර යථාර්ථවාදියා යනු ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි බිහිවූවකු බව ය.

එහෙත් ලෝකයට ලෝකය පිළිබඳ දැනුමක් ලබාගත හැකි ය යන්න පෙරදිග චින්තනවල වලංගු වූවක් වෙයි. මෙය තවදුරටත් විභාග කළයුතු ය. ලෝකයේ පැවැත්ම ඒ පැවැත්ම පිළිබඳ දැනුමෙන් වෙන් නොකරන සංස්කෘතීන්හි එවැනි දැනුමක් තිබිය හැකි ය. එහි දී ලෝකය මවන්නාම, ලෝකය පිළිබඳ දැනුම ඇත්තාම ලෝකය ද බවට පත්වෙයි. බ්‍රහ්මන් යනු එවැනි සංකල්පයක් වෙයි ~

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva